# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
## சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
## Ministry of Health & Mass Media

# "ඇසිදිසි - තාක්ෂණික" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන - 2026
## මාධ්‍යවේදීන්ගේ තාක්ෂණික ප්‍රවේශය සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම

**අරමුණ**

➤ ශ්‍රී ලාංකේය ජනමාධ්‍යවේදීන්ගේ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම

**ඉලක්කගත කණ්ඩායම**

➤ වසර 02ක සේවා කාලයක් සපුරා ඇති හා අංක 2413/44 දරන 2024.12.05 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් වර්ගීකරණයට අයත් මාධ්‍යවේදියෙකු විය යුතුය.
**(http://www.news.lk/images/pdf/sinhala%20gazette.pdf)**

**තෝරා ගැනීමේ නිර්ණායක**

➤ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට පහත සඳහන් පාඨමාලා සඳහා තෝරාගෙන ඇති හෝ දැනට එම පාඨමාලාවක් හදාරන හෝ අයෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී පාඨමාලාව සඳහා තෝරාගත් බවට හෝ එය හදාරන බවට හෝ අදාළ ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ලිපි ඉදිරිපත් කළ යුතුය).

➤ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18–55 අතර විය යුතුය.

➤ ජනමාධ්‍යවේදීන් සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් 2025/2026 වර්ෂයට අදාළව නිකුත් කළ මාධ්‍ය හැඳුනුම්පත ලබා තිබිය යුතුය.

➤ "ඇසිදිසි" ජනමාධ්‍ය ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය ඔස්සේ ප්‍රතිලාභ ලබා ඇති අයදුම්කරුවෙකු නැවත අයදුම්කරන්නේ නම් එම පාඨමාලාව සාර්ථකව අවසන් කර තිබිය යුතුය.

**මූල්‍ය පහසුකම් ලබාදීම**

➤ මෙම වැඩසටහනට සමගාමීව ක්‍රියාත්මක කරන **"ඇසිදිසි ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන – 2026"** සඳහා ඉල්ලුම් කරන මාධ්‍යවේදීන්ට මෙම වැඩසටහන සඳහා ද ඉල්ලුම් කළ හැකි අතර, වැඩසටහන් දෙක සඳහාම උපරිම මූල්‍ය සීමාව රු. 350,000/–කි.

**පාඨමාලා හා ඒවා පිරිනමන ආයතන**

i. **ජනසන්නිවේදන අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය**
- Advanced Certificate in Digital Arts and Multimedia Studies

ii. **ලේක්හවුස් ඇකඩමිය - සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම**
- ඩිජිටල් මාධ්‍යවේදී ඩිප්ලෝමා පාඨමාලාව
- ඡායාරූපකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව

iii. **ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**
- Advanced Certificate in 3D Modeling & Animation
- Advanced Certificate in Non- Linear Editing for screen
- Advanced Certificate in Web Design
- Diploma in Graphic Design

iv. **MMC Campus – සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය**
- Lighting Effects and Principles for Indoor & Outdoor Events
- Sound Engineering Principles for Indoor & Outdoor Events
- Digital Media Content Creation for all Platforms

v. **මාධ්‍ය ඇකඩමිය - ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව**
- ශ්‍රව්‍ය මාධ්‍ය වැඩසටහන්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

vi. **පර්යේෂණ හා පුහුණු ඒකකය - ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව**
- ජනමාධ්‍යවේදීන් සඳහා වූ Broadcast Journalism පුහුණු වැඩසටහන

❖ මෙයට අමතරව මාධ්‍යයට සම්බන්ධ වෙනත් තාක්ෂණික විෂයයක් ඉල්ලුම් කළහොත් ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව සලකා බලනු ඇත.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

➤ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තේරීම් කමිටුවකින් සම්මුඛ පරීක්ෂණයට යොමු කර ප්‍රතිලාභීන් තෝරාගනු ඇත. තෝරා ගැනීමේ අවසාන තීරණය අමාත්‍යාංශ ලේකම් සතු වේ.

**අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

➤ පහත QR කේතය ස්කෑන් කර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හෝ www.media.gov.lk වෙබ් අඩවියට සෘජුවම පිවිස එහි ඇති අයදුම්පත සම්පූර්ණ කර හෝ **අධ්‍යක්ෂ (සංවර්ධන), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 163, "ඇසිදිසි මැදුර", කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරෙහි **"ඇසිදිසි – තාක්ෂණික ජනමාධ්‍ය ශිෂ්‍යත්ව වැඩසටහන – 2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

➤ අයදුම්පත් භාර ගැනීම 2026 ජූලි මස 10 දිනෙන් අවසන් වේ.

**සැලකිය යුතුය**

➤ ශිෂ්‍යත්ව පිරිනැමීමෙන් අනතුරුව අමාත්‍යාංශය සමග ගිවිසුමකට එළඹිය යුතු අතර, අදාළ පාඨමාලාව උපරිම මාස 06ක් ඇතුළත ආරම්භ කළ යුතු වේ. නොඑසේ නම් ශිෂ්‍යත්වය අවලංගු කිරීමට කටයුතු කරනු ඇත.

**විමසීම : 011-2513737 / චන්දන - 071-4931696**
**දුල්මිණි - 071-2166492 / වින්ධ්‍යා - 076-6925420**
**වැඩි විස්තර : www.media.gov.lk**

**ලේකම්,**
**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.**